### බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

# ආශ්‍රිත සේවා ගණයේ තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුවී ඇති ආශ්‍රිත සේවා ගණයේ පහත තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීමට ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ආශ්‍රිත සේවා ගණය - (MN - 4 - 2016)**

**02. තනතුරු පුරප්පාඩු**

- **කෞතුකාගාර අධිකාරී - 01**
- **සම්ප්‍රදායික කලා සහකාර - 01**
- **ප්‍රදර්ශන සැලසුම් නිලධාරී - 01**
- **පර්යේෂණ සහකාර - 06**
- **අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී - 05**
- **ප්‍රධාන ආරක්ෂක නිලධාරී - 02**

**2.1 අධ්‍යාපන සුදුසුකම්**

| | |
|---|---|
| **කෞතුකාගාර අධිකාරී** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. |
| **සම්ප්‍රදායික කලා සහකාර** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලලිත කලාවේදී (චිත්‍ර) උපාධියක් ලබා තිබීම. |
| **ප්‍රදර්ශන සැලසුම් නිලධාරී** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාස්තු විද්‍යාව හා නිර්මිත පරිසරය පිළිබඳ උපාධික් ලබා තිබීම. |
| **පර්යේෂණ සහකාර** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම. ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ මානව වංශ විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් හෝ ඇතුළත්ව උපාධියක් ලබා තිබීම. |
| **අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම. ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ මානව වංශ විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් හෝ ඇතුළත්ව උපාධියක් ලබා තිබීම. |
| **ප්‍රධාන ආරක්ෂක නිලධාරී** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. |

**2.2 වෘත්තීය සුදුසුකම්**

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ. සුදුසුකම් පිළිබඳ සහතික මගින් සනාථ කළ යුතුය.

ප්‍රධාන ආරක්ෂක නිලධාරී - ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකායේ කැඩෙට් නිලධාරියෙක් ලෙස පුහුණුව ලබා තිබීම හෝ ආරක්ෂාව සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම.

**2.3 පළපුරුද්ද**

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ. (එම පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

**සාම්ප්‍රදායික කලා සහාකාර :** පැරණි චිත්‍ර පිටපත් කිරීම, ඒවා සංරක්ෂණයේදී නැවත පින්තාරු කිරීම පැරණි කලාත්මක භාණ්ඩ වල ආදර්ශක ඇඹීම ආදිය ගැන මනා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

**2.4 වෙනත් සුදුසුකම්**

(අ.) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ආ.) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ.) 2021.08.13 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

(ඇ.) සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ.) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සියලු සුදුසුකම් සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2.5 වැටුප් ක්‍රමය : MN - 4 - 2016**

රු. 31,490 - 10X445 - 11X660 - 10X730 - 5X750 - 54,250/- වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවරට බඳවා ගනු ලැබේ.

**සටහන :** ඉහත වැටුප් පරිමාණයන් හා ඒ ඒ ශ්‍රේණි වලට අදාළ ආරම්භක වැටුප් පියවරයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපදෙස්වලට යටත් වේ.

**2.6 බඳවා ගැනීමේ ක්‍රමය**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය මත බඳවා ගනු ලැබේ. (සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. සුදුසුකම් පමණක් පරීක්ෂා කෙරේ)

➢ **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

**යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.**

| | ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 02. | වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. | භාෂා ප්‍රාගුණ්‍යය | 15 | |
| 04. | පරිගණක දැනුම | 20 | |
| 05. | පුහුණුව හා පළපුරුද්ද | 30 | |
| 06. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| | **මුළු ලකුණු** | **100** | |

**සටහන :** (I) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

**03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි**

මෙම තනතුරු ස්ථිරය. පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. බඳවාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**04. අයදුම්පත් එවිය යුතු ආකාරය**

- අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයාගේ අත් අකුරින් හෝ පරිගණක භාවිතයෙන් සම්පූර්ණ කළ යුතුය.
- අංක 01 සිට 08 දක්වා වන ශීර්ෂ 01 වන පිටුවට ද අංක 09 සිට 11 දක්වා වන ශීර්ෂ 02 වන පිටුවටද අංක 12 සිට 14 දක්වා වන ශීර්ෂ 03 වන පිටුවටද, අංක 15, 16 වන ශීර්ෂ 04 වන පිටුවටද වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුය.
- නියමිත ආකෘතියට අනුකූලව සැකසූ අයදුම්පත් 2021.08.17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, තැ.පෙ. 854, කොළඹ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- නියමිත ආකෘතියට සකස් නොකළ හෝ නිසියාකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.
- අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරනු ලබයි නම්, වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**05. අත්සන සහතික කරවා ගැනීම**

පූජ්‍ය ස්ථාන භාර පූජකවරයකු / සමාදාන විනිශ්වයකාරවරයෙකු / රජයේ විදුහල්පතිවරයෙකු හෝ 240,360/- ට නොඅඩු ආරම්භක වාර්ෂික වැටුපක් හිමි වැටුප් පරිමාණයක සේවය කරනු ලබන රජයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

**06. වෙනත්**

I. අයදුම්පත් එවීමේදී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) / (උසස් පෙළ) විභාග සහතිකයේ, අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් හෝ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික, ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකායේ කැඩෙට් නිලධාරියෙක් ලෙස පුහුණුව ලත් ආයතනයේ හෝ ආරක්ෂාව සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක ලබාගත් පාඨමාලා සහතිකයේ හා උපාධි සහතිකයේ සහ උපාධි ප්‍රතිඵල දත්ත සහතිකය (Detail Certificate) යන සියලු ලිපිලේඛනවල ඉල්ලුම් කරනු ලබන තනතුරට අදාළ සහතිකවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය. **සහතික කළ පිටපත් අමුණා නැති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

II. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණක් පිළිබඳව සහ බඳවා ගැනීම් සම්බන්ධ කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,**
**අංක 53, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,**
**කොළඹ 07.**

## ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**01. අයදුම් කරන තනතුර :**

1. කෞතුකාගාර අධිකාරී - 01
2. සම්ප්‍රදායික කලා සහකාර - 01
3. ප්‍රදර්ශන සැලසුම් නිලධාරී - 01
4. පර්යේෂණ සහකාර - 06
5. අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී - 05
6. ප්‍රධාන ආරක්ෂක නිලධාරී - 02

**02. අයදුම්කරුගේ නම :**

2.1 මුලකුරු සමග නම
I. සිංහලෙන් / දෙමළෙන් : ........................................
II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) : ........................................
........................................

2.2 මුලකුරුවලින් හැඳින්වෙන නම :
I. සිංහලෙන් / දෙමළෙන් : ........................................
II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) : ........................................
........................................

**03. ලිපිනය :**

I. පෞද්ගලික ලිපිනය :
........................................
........................................
II. දිස්ත්‍රික්කය : ........................................
III. රාජකාරී ලිපිනය (රැකියාවක් කරන්නේ නම්) : ........................................

**04. ජාතික හැඳුනුම්පත් අංකය :** ☐☐☐☐☐☐☐☐☐☐☐☐

**05. ස්ත්‍රී / පුරුෂ භාවය :** පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐
ස්ත්‍රී - 1

**06. දුරකථන අංකය :** පෞද්ගලික : .................... රාජකාරී : ....................

**07. විවාහක / අවිවාහක බව :** ........................................

**08. ජන වර්ගය :** ........................................

**09. පුරවැසි භාවය :** පරම්පරාවෙන් / ලියාපදිංචි වීමෙන්

**10. උපන් දිනය :** වර්ෂය ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2021.08.13 දිනට වයස : අවු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

**11. අධ්‍යාපන සුදුසුකම් :**

**I. අ.පො.ස. (සා/පෙළ) විභාගය**

විභාග අංකය .................... වර්ෂය ....................
මාධ්‍යය : ....................

| 01. | සමත්වූ විෂයන් | ශ්‍රේණිය |
|---|---|---|
| (01) | .................... | .................... |
| (02) | .................... | .................... |
| (03) | .................... | .................... |
| (04) | .................... | .................... |
| (05) | .................... | .................... |
| (06) | .................... | .................... |
| (07) | .................... | .................... |
| (08) | .................... | .................... |

**II. අ.පො.ස. (උ/පෙළ) විභාගය :**

විභාග අංකය .................... වර්ෂය ....................
මාධ්‍යය : ....................

| | සමත්වූ විෂයන් | ශ්‍රේණිය |
|---|---|---|
| (01) | .................... | .................... |
| (02) | .................... | .................... |
| (03) | .................... | .................... |
| (04) | .................... | .................... |

**III. උපාධිය පිළිබඳ විස්තර (ආශ්‍රිත සේවා ගණය යටතේ තනතුරු සඳහා අයදුම් කරන්නන් හට අදාළ වේ)**

| උපාධිය | බාහිර / අභ්‍යන්තර | පංති සාමාර්ථය | උපාධිය වලංගු දිනය | භාෂා මාධ්‍ය | හදාරණ ලද විෂයයන් | ලියාපදිංචි අංකය | විශ්ව විද්‍යාලය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**12. වෘත්තීය දැනුම හා කුසලතාවයන් පිළිබඳ විස්තර (සුදුසුකම් මට්ටම අදාළ වේ නම්)**

| අදාළ වෘත්තීය පාඨමාලාව | ආයතනය | වෘත්තීය සහතිකය / සමත් මට්ටම | ප්‍රතිඵල වලංගු දිනය |
|---|---|---|---|
| | | | |

**13. (I) පළපුරුද්ද පිළිබඳ විස්තර :**

| අදාළ තනතුර | ආයතනය | සේවයේ නියුක්තව සිටි කාලය |
|---|---|---|
| | | |

(II) භාෂා ප්‍රාගුණ්‍යය : මාධ්‍ය භාෂාවට අමතරව දෙවන භාෂාවක ලබා ඇති ප්‍රවීණතාව.
I. අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ට / අධි සම්මාන / සම්මාන / සාමාන්‍ය සාමාර්ථය.
II. අ.පො.ස. (උ.පෙළ) විශිෂ්ට / අධි සම්මාන / සම්මාන / සාමාන්‍ය සාමාර්ථය
III. වෙනත් - ........................................

සැ.යු. : 11 / 12 / 13 අනු අංක සඳහා සියලු සහතිකවල සහතික පිටපත් අමුණා එවිය යුතුය.

**14. දැනට යම් කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :**

01. තනතුර හා ශ්‍රේණිය : ....................
02. පත් වූ දිනය : ....................
03. ආයතනය : ....................
04. විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද යන වග : ....................

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

.................... ....................
**දිනය** **අයදුම්කරුගේ අත්සන**

**15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු / ඇය මා ඉදිරිපිටදී අත්සන් තබන ලද බවත්, අදාළ සහතික පිටපත් අමුණා ඇති බවත් සහතික කරමි.

.................... ....................
**දිනය** **සහතික කරන්නාගේ අත්සන**

සහතික කරන්නාගේ නම : ....................
තනතුර ....................
ලිපිනය ....................
නිල මුද්‍රාව ....................

**16. රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

.................... මහතා / මහත්මිය / මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

.................... ....................
**දිනය** **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන**
**නිල මුද්‍රාව**